# CYPRUS POLICE

# ΔΙΚΑΙΩΜΑΤΑ ΚΡΑΤΟΥΜΕΝΩΝ, ΚΑΝΟΝΕΣ ΚΡΑΤΗΤΗΡΙΟΥ ΚΑΙ ΥΠΟΧΡΕΩΣΕΙΣ ΚΡΑΤΟΥΜΕΝΩΝ

**SINHALA(SRI LANKA)**

**ΠΡΩΤΟΣ ΠΙΝΑΚΑΣ**
**(Κανονισμός 3(1))** **ΜΕΡΟΣ Ι**

## ΚΑΤΑΛΟΓΟΣ ΔΙΚΑΙΩΜΑΤΩΝ ΚΡΑΤΟΥΜΕΝΩΝ

## PART A

1. ඔබව රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළත් කළ වහාම ඔබට දුරකථනයෙන් පුද්ගලිකව සම්බන්ධවීමට අයිතියක් ඇත:

   (a) වෙනත් කිසිඳු පුද්ගලයෙකු නොමැතිව ඔබ කැමති නීතිඥයෙකු සමඟ;

   (b) කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සමඟ,ඔබ කැමති ඕනෑම ඥාතියෙකු හෝ වෙනත් පුද්ගලයෙක් සමඟ, ඔබ වයස අවුරුදු දහ අටට අඩු නම් ඔබේ දෙමාපියන් හෝ භාරකරුවන්ගෙන් ඕනෑම අයෙකු සමඟ, ඔබේ අත්අඩංගුවට ගැනීම සහ ඔබ රඳවාගෙන සිටින ස්ථානය පිළිබඳව ඔවුන්ට දැනුම් දීම සඳහා.

2. ඉහත උප ඡේදය (b) සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් වහාම ඉන් පැය දොළහකට නොවැඩි කාලයක් සඳහා සන්නිවේදන අයිතියක් ලබා නොදෙනු ඇත, උප ඡේදයේ දක්වා ඇති පුද්ගලයා සමඟ අත්අඩංගුවට ගත් වහාම සන්නිවේදන අයිතිය ක්‍රියාත්මක කලහොත් පහත සඳහන් දේ සිදු විය හැකි බවට සාධාරණ සැකයක් තිබේ නම්:

   (a) පුද්ගලයින් හඳුනා ගැනීමට අදාළ හෝ කිසියම් නඩුවකට අදාළ සාක්ෂි විනාශ කිරීමට හෝ වසන් කිරීමට හේතු වීම;

   (b) නීති විරෝධී ලෙස ජනරජයේ සිටින වෙනත් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම වැළැක් වීම හෝ ඔහු/ඇය පැන යාමට මග පෑදීම;

   (c) වෙනත් වරදක් සිදු කිරීම හෝ වෙනත් පුද්ගලයෙකුට මරණය හෝ පුද්ගලික තුවාල සිදු කිරීම;

   (d) ජනරජයේ ආරක්ෂාවට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ මහජන නියෝග වලට හෝ යුක්තිය පසිඳලීමේ කටයුතු සඳහා මැදිහත් වීම.

3. යම් පුද්ගලයෙකු රැඳවුම් මධ්‍යස්ථානයට ගෙන යන විට සහ කිසියම් මානසික ඌනතාවයක් හෝ ශරීර ආබාධයක් හේතුවෙන්, ඉහත සඳහන් කළ සන්නිවේදන අයිතීන් ගේ සහය නොමැතිව ක්‍රියාත්මක කිරීමට පැහැදිලිව නොහැකි නම්, රජයේ සමාජ සේවා හෝ/ වෛද්‍ය නිළධාරියෙකුගේ සහය හෝ/ ඉදිරිපත් වීම ඇතිව ඔහුට/ඇයට ඒ සඳහා ක්‍රියාත්මක කිරීම සඳහා අයිතියක් ඇත,ඉහත විස්තර කළ අවස්ථාවන්හිදී ඔහු/ඇය අත්අඩංගුවට ගැනීමෙන් පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් පැය දොළහක් (12) ඇතුළත ඔහුට/ඇයට මෙය ලබා දිය යුතුයි.

4. ඉහත සඳහන් කළ අයිතීන්ට අමතරව, පොලිසියේ සාමාජිකයෙකු ඉදිරියේ ඔබගේ ජාතිකත්වය දරණ ජනරජයේ සිටින කොන්සියුලර් හෝ රාජ්‍ය තාන්ත්‍රික නිළධාරියෙකුට ඔබගේ අත් අඩංගුවට පත්වීම හෝ රැඳවුම් මධ්‍යස්ථානය පිළිබඳව, අත් අඩංගුවට පත්වීමෙන් පසු හැකි ඉක්මනින් ප්‍රායෝගිකව,පෞද්ගලිකව දුරකථනය මගින් සම්බන්ධ කරගෙන දැනුම් දීමට ඔබට අයිතියක් ලැබේ සහ කොන්සියුලර් හෝ රාජ්‍ය තාන්ත්‍රික නිළධාරියෙක් ජනරජයේ නොමැති නම්, පරිපාලන කොමසාරිස් කාර්යාලය හා සම්බන්ධ විය හැක.

5. ඔබ රඳවා සිටින රැඳවුම් මධ්‍යස්ථානයේ, කිසියම් කාර්ය මණ්ඩල සාමාජිකයෙට නොපෙනෙන සහ නොඇසෙන පුද්ගලික ප්‍රදේශයක ඔබේ නීතිඥවරයා සමඟ ඔබේ ආරක්ෂාව සඳහා රහස්‍ය සම්මුඛ සාකාච්ඡා පැවැත්වීමට ඔබට ඕනෑම දිනක සහ වේලාවක හිමිකම් ඇත, සහ සම්මුඛ සාකාච්ඡා අතර තුරදී ඔහුට/ඇයට ඔබට ලබා දීමට සහ ඔහු/ඇය ගෙන් ලිඛිතව හෝ වාචිකව රහස්‍ය උපදෙස් ලබා ගැනීමට අයිතියක් ඇත.

6. ඔබ අවුරුදු දහඅටට අඩු නම්, ඔබගේ දෙමාපියන් හෝ භාර කරුවන්ද නීතිඥ වරයා සමඟ සම්මුඛ සාකාච්ඡා සඳහා සහභාගි වීමට සුදුසු කම් ලබයි.

7. කිසියම් හේතුවක් නිසා ඔබේ නීතිඥවරයාට තේරුම් ගත හැකි භාෂාවකින් ඔබ සමඟ සන්නිවේදනය කළ නොහැකි නම්, ඔබේ නීතිඥවරයාගේ ඉල්ලීම පරිදි භාෂා පරිවර්තකයෙකුට හෝ වෙනත් පුද්ගලයෙකුට සම්මුඛ සාකාච්ඡාවලට සහභාගි විය හැකිය. එවිට ඔබේ නීතිඥවරයාට තේරුම් ගත හැකි භාෂාවකින් ඔබ සමඟ සන්නිවේදනය කළ හැකිය.

8. ඔබ ඔබේ නීතිඥවරයාට තවදුරටත් ඔබ ඔහුගේ/ඇයගේ සේවාව බලාපොරොත්තු නොවන බව පෙන්වා දී ඇත්නම්, නීතිඥයෙකු වෙත ඔබේ ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකිය, සහ රැඳවුම් මධ්‍යස්ථානයේ කළමනාකරුට එය ලිඛිතව දැනුම් දිය යුතුයි.

9. පහත සඳහන් පරිදි ඔබට ලිපි යැවීමට සහ ලැබීමට ඔබට අයිතියක් ඇත:

(a) කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් කියවීමකින් හෝ විවෘත කිරීමකින් තොරව ඔබේ නීතිඥවරයා වෙත සහ නීතිඥවරයාගෙන්,ලියුම් කවරයේ නීති විරෝධී යමක් ඇති බවට රැඳවුම් මධ්‍යස්තානයේ කළමණාකරු සාධාරණ ලෙස විශ්වාස කරන විශේෂ අවස්ථාවලදී හැර, එවැනි අවස්ථාවල කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් ඔබ ඉදිරියේ ලියුම විවෘතකර පරීක්ෂා කරනු ලබයි.

(b) මානව හිමිකම් පිළිබඳ යුරෝපීය අධිකරණය,ජනරජයේ නීතිපතිවරයා,පරිපාලන කොමසාරිස්සහ ඕනෑම ජාත්‍යන්තර සහ ජාතික මානව හිමිකම් කොමිසම, මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ චෝදනා විභාග කිරීමට සහ තිරණය කිරීමට හෝ පැමිණිලි සලකා බැලීමට හැකියාව ඇති ආයතනයට හෝ අධිකාරියකට පුද්ගලයින් රඳවා තබා ගැනීම සම්බන්ධයෙන්, කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ විවෘත කිරීමකින් හෝ කියවීමකින් තොරව ලිපි යැවීමට සහ ලිපි ලබාගැනීමට හැකියාව ඇත.

(c) ඔබ ඉදිරියේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ පරීක්ෂාවකින්,පවුලේ අයට, මිතුරන්ට සහ ඔබ සමඟ සම්බන්ධ වීමට නීත්‍යානුකූල අයිතිය ඇති අනෙකුත් පුද්ගලයින් වෙත සහ ඔවුන්ගෙන්. යම් හෙයකින් නීති විරෝධී යමක් ලියුම් කවරය ඇතුළත තිබුන හොත් හෝ ලියුම් කවරයේ අඩංගු දේ රැඳවුම් මධ්‍යස්ථානයේ හෝ රැඳවියන්ගේ හෝ වෙනත් පුද්ගලයින්ගේ ආරක්ෂාවට තර්ජනයක් වුවහොත් හෝ යම් ආකාරයකින් වෙනත් සාපරාධී ක්‍රියාවක ස්වාභාවයක් හෝ අපරාධ හඳුනා ගැනීමට හෝ විමර්ශන වලට බාධා ඇතිවීමේ ස්වාභාවයක් ගනු ලබන අවස්ථාවක ලිපිය යැවීම හෝ භාරදීම කළ නොහැකි.

10. රැඳවුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ඉදිරියේ ඔබට සහ ඔබ කැමති ඕනෑම ඥාතියෙකු හෝ වෙනත් පුද්ගලයෙකුට සහ රඳවා සිටින පුද්ගලයා අවුරුදු දහඅටට අඩුනම් ඔහුගේ/ඇයගේ දෙමාපියන් හෝ භාරකරුවන්ට,පෞද්ගලික ප්‍රදේශයක පැයක් දක්වා දිනපතා හමුවීමට හිමිකමක් ඇත.

11. ඉහත සඳහන් අයිතීන් සඳහා ඔබේ ජාතිකත්වය දරණ ජනරජයේ සිටින කොන්සියුලර් හෝ රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයෙකුට හිමිකම් ඇත සහ ජනරජයේ කොන්සියුලර් හෝ රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයෙකු නොමැති නම්, ඕනෑම ජාත්‍යන්තර හෝ ජාතික මානව හිමිකම් සංවිධානයකට හෝ අධිකාරය නියොජිත වරයෙකුට ඒ සඳහා හිමිකම් ඇත.

12. ඔබට හිමිකම් ඇත:

(a) වධහිංසාවට හෝ අමානුෂික හෝ අවමන් සහගත දඬුවමකට හෝ සැලකීමට හෝ කිසියම් ආකාරයක කායික හෝ මානසික හෝ මානසික ප්‍රචණ්ඩත්වයකට ලක් නොකිරීමට ඔබට ඇති අයිතියට ගරු කිරීම:

(b) යහපත් ලෙස සැලකීම,හැසිරීම සහ ජීවන තත්වයන්:

(c) මූලික පහසුකම් සහ සනිපාරක්ෂක තත්වයන්,ප්‍රමාණවත් ආලෝකය සහ වාතාශ්‍රය සහ විවේක ගැනීමට සුදුසු උපකරණ සහිත සාධාරණ ප්‍රමාණයේ සිර කුටියක ජීවත් වීම

13. වයස අවුරුදු දහ අටට අඩු රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන් අනෙකුත් රැඳවුම්කරු වන්ගේ සිර කුටිවලින් වෙන් වූ සිර කුටියක ජීවත් විය යුතුයි.

14. රැඳවුම් භාරයේ සිටින විරුද්ධ ලිංගික පුද්ගලයින් වෙන් වෙන් වූ සිරකුටිවල ජීවත් විය යුතුයි.

15. යම් හෙයකින්,ඔබ කාන්තාවක් නම්,ඔබට හිමිකම් ඇත:

(a) සෘජු හෝ වක්‍ර ලෙස ලිංගික හිරි හැරයක් හෝ ඔබගේ ආත්ම අභිමානයට කැලලක් සිදු නොවන ලෙස හැසිරීම හා සැලකීම:

(b) ඔබ කිරිදෙන මවක් නම්, ඔබ සිරගත වී සිටින කාලය තුළ රැඳවුම් මධ්‍යස්ථානයේ පෞද්ගලික කාමරයක මව් කිරි දීම අඛණ්ඩව කරගෙන යා හැකි අතර, ඔබ කැමති නම්,ළඳරුවා ඔබ ජීවත් වන සිර මැදිරිය තුළ ඔබේ වියදමින් ඔබ සමඟ සිටිය හැකියි.

(c) අවශ්‍ය පුද්ගලික සනිපාරක්ෂක ද්‍රව්‍ය හෝ ඔබේ අභිමත පරිදි අවශ්‍ය පුද්ගලික සනිපාරක්ෂක ද්‍රව්‍ය, ඔබගේ වියදමින් ඔබට මිලදී ගත හැක:

(d) ඔබ ගැබ් ගෙන ඇත්නම්, ගර්භණීභාවයට හෝ ඔබේ හෝ කලලයට ඇති වියහැකි අහිතකර බල පෑම් වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

16. ඔබ කැමති ඕනෑම වෙලාවක, ඔබගේ අභිමත පරිදි කැමති වෛද්‍යවරයෙකු විසින් පරීක්ෂා කිරීමට සහ/හෝ ප්‍රතිකාර කැරීමට සහ/හෝ අධීක්ෂණය කිරීමට සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු ඉදිරියේ ඔබට පෞද්ගලිකව ඔහු/ඇය සමඟ දුරකථනයෙන් සම්බන්ධ වීමට හැකිය හෝ ඔබ කැමති වෛද්‍යවරයෙකු තෝරා ගැනීමට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමට අකමැති නම්, රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකරු විසින් රජයේ වෛද්‍යවරයෙකු පරීක්ෂා කිරීමට සහ/හෝ ප්‍රතිකාර කැරීමට සහ/හෝ අධීක්ෂණය කිරීමට පියවර ගනු ලබයි.

ඔබ කැමති වෛද්‍යවරයා විසින් සිදු කරන පරීක්ෂණ, ප්‍රතිකාර සහ අධීක්ෂණ සඳහා යන වියදම් ඔබ විසින් ගෙවිය යුතුයි.

17. ඉහත සඳහන් කළ අයිතිය ක්‍රියාත්මක කිරීමට ඔබට අවශ්‍ය නම්, අදාළ පෝරමය සම්පූර්ණ කර අත්සන් කර කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට භාර දිය යුතුයි. කාර්ය මණ්ඩල සාමාජිකයෙක විසින් අත්සන් කර පෝරමයේ කුවිතාන්සිය භාරගත් පසු පෝරමයේ පිටපතක් තබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

18. ඔබ වෛද්‍යවරයෙකු විසින් පරීක්ෂා කිරීමට සහ/හෝ ප්‍රතිකාර කිරීමට සහ/හෝ අධීක්ෂණය කිරීමට යුතු වේ නම්,ඉහත කී දෑ හැකි ඉක්මනින් ,රැඳවුම් මධ්‍යස්ථානයේ හෝ රජයේ රෝහලක, සිදු කිරීමට අවශය කටයුතු සැලසීම රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකාර තුමාගේ කාර්යභාරයවේ,එය ඔබේ සෞඛ්‍ය තත්වයේ අවශ්‍යතාවය මත පදනම්වේ.

19. සියළුම වෛද්‍ය පරීක්ෂණ, ප්‍රතිකාර සහ නිරීක්ෂණයන් කාර්ය මණ්ඩලයේ කිසිවෙකුට නොපෙනෙන ලෙස සහ නොඇසෙන ලෙස පුද්ගලික කාමරයක් තුළ සිදු විය යුතුයි

ඕනෑම වෛද්‍ය පරීක්ෂණයක්,ප්‍රතිකාරයක් සහ පසු විපරමක් සිදු කළ හැක්කේ ඔබ හා සමාන ලිංගිකත්වයක් දරන කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ දෘෂයේ,නොඇසෙන පරිදි,වෛද්‍යවරයා සිදු කරන ශාරීරික පරීක්ෂා කිරීම් වෙනත් ආකාරයක අවදානමකට ලක්වීමට හැකි බව බන්ධනාගාර කළමනාකාරීත්වයට විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු තිබෙන නිසා බව තේරුම් ගත යුතුයි.

20. ඔබ වයස අවුරුදු දහ අටට අඩු නම්,ඔබේ දෙමාපියන්ට හෝ භාරකරුවන්ට ඕනෑම වෛද්‍ය පරීක්ෂණයකට,ප්‍රතිකාරයකට සහ අධීක්ෂනයකට පෙනී සිටීමට අයිතියක් ඇත.

21. වෛද්‍යවරයාට තේරුම් ගත හැකි භාෂාවෙන් ඔබ සමඟ සන්නිවේදනය කළ නොහැකි නම්, භාෂා පරිවර්තකයෙකු හෝ වෙනත් පුද්ගලයෙකු රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකරු විසින් ඔබට ලබා දිය යුතුවේ සහ වෛදයවරයාගේ ඉල්ලීම පරිදි වෛද්‍ය පරීක්ෂණ, ප්‍රතිකාර කිරීම සහ නිරීක්ෂණ කිරීම් සඳහාද පෙනී සිටිය හැකිය, එවිට වෛද්‍ය වරයාට ඔබට තේරුම් ගත හැකි භාෂාවකින් ඔබ සමඟ සන්නිවේදනය කළ හැකිය.

22. සෑම සිරකුටියක් තුළම රැඳවුම් භාරයේ සිටින පුද්ගලයින්ගේ අයිතීන් ඇළත් ලැයිස්තුවක් සහ රැඳවුම් මධ්‍යස්ථානයේ නීතිරීති, ඒ වාගේම රැඳවුම් භාරයේ සිටින පුද්ගලයින්ගේ වගකීම් ඇතුළත් ලැයිස්තුවක් විවිධ භාෂාවලින් ඇත, අත්‍යවශ්‍යයැයි සැලකෙන පරිදි. මෙම ලැයිස්තුවල පිටපත් රඳවා සිටින සෑම පුද්ගලයෙකුටම ඔහුට/ඇයට තේරුම් ගත හැකි භාෂාවකින් ලබාදිය යුතුයි.

**PART B**

මම, ……………………………………………………,මා හට තේරුම් ගත හැකි භාෂාවෙන් ඉහත සඳහන් රැඳවුම් භාරයේ සිටින පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ඇතුළත් ලැයිස්තුවක් ලැබී ඇත.

දිනය/Date .................

වේලාව/Time ........................

රැඳවුම් කරුගේ අත්සන/Detained person’s signature

................................

Σε περίπτωση άρνησης του/της να παραλάβει αντίγραφο του εν λόγω καταλόγου ή άρνησης να υπογράψει, να σημειώνονται οι λόγοι της άρνησης.
…………………………………………………………………………………………………
…………………………………………………………………………………………………
…………………………………………………………………………………………………
………………………………………………………………………………………………….

……………………………………
Υπογραφή μέλους του προσωπικού
(ονοματεπώνυμο)

## ΚΑΝΟΝΕΣ ΚΡΑΤΗΤΗΡΙΟΥ

- අමුත්තන්ගේ කාලය පෙ.ව 9.00 සිට හිරු බැසයාමට පැයකට පෙර වේ.

- ඔබගේ නීතිඥ තුමා සමඟ සම්මුඛ සාකාච්ඡාවකට ඇති අයිතිය ඕනෑම දිනක සහ වේලාවක භාවිතා කළ හැකිය.

- උදෑසන ආහාරය 7 පෙ.ව - 9 පෙ.ව

- දහවල් ආහාරය 12 ප.ව - 2 ප.ව

- රාත්‍රී ආහාරය 6 ප.ව- 8 ප.ව

- නිදන වේලාව 10ප.ව දක්වා

- ජංගම දුරකථන,මුදල්,ස්වර්ණාභරණ,ඖෂධ,ගිණි කූරු,ලයිටර්,ලේස්,පටි,ටයි,රේසර් සහ වෙනත් අනතුරුදායක ද්‍රව්‍ය කුටිය තුළට ගැනීමට අවසර නැත.

- ඔබට බෙහෙත් වර්ග ලබාදිය හැක්කේ වෛද්‍ය නිර්දේෂ මත වූ බෙහෙත් වට්ටෝරුවකට හෝ උපදෙස් මත පමණි.

- මධ්‍යසාර පානවලට අවසර නැත.

- පාලන අධිකාරය විසින් ලබා දෙන ආහාර අනවශ්‍ය නම්, රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකාරිත්වයට පෙර දැනුම් දීමකින් පසුව,ඔබගේ මුදලින් ආහාර මිලදී ගත හැක සහ ආරක්ෂක හේතූන් මත එය පරීක්ෂාවට ලක් කරනු ලබයි.

- ඔබගේ රැඳවුම් ප්‍රදේශයේ අපද්‍රව්‍ය නොදැමීම ඔබගේ වගකීමකි.

- බාධා(ගැටළු) ඇති කිරීමට ඉඩ නොදේ.

- රැඳවුම් මධ්‍යස්ථානයට හිතා මතා ආලාභ හානි කළහොත්, ඔබට එරෙහිව අපරාධ නඩු පැවරීමට හැකිවන අතර සහ එය අළුත් වැඩියා කිරීමට යන මුදල ඔබගෙන් අය කරගැනීමට සිදුවේ.

---

**Να αναρτάται σε περίοπτο χώρο του κρατητηρίου και να δίδεται αντίγραφο στον κρατούμενο, σε γλώσσα καταληπτή από τον ίδιο.**

**රැඳවුම් මධ්‍යස්ථානයේ වැදගත් ස්ථානයක තැබීමට සහ පිටපත් රඳවා සිටින පුද්ගලයාට ඔහුට/ඇයට තේරෙන භාෂාවකින් ලබා දිය යුතුයි.**

**ΜΕΡΟΣ III**

## ΔΗΛΩΣΗ ΚΡΑΤΟΥΜΕΝΟΥ

මා, ...........................................................................,තවදුරටත් නීතීඥවරයෙකුගේ සේවය බලාපොරොත්තු නොවන බවට ප්‍රකාශ කර සිටිමි.........................................................
…………………………………………………………………………………………………………

දිනය/Date .........................

වේලාව/Time ............................ රැඳවුම් කරුගේ අත්සන /Detained person’s signature

.......................….........................………

……………………………………
Υπογραφή μέλους του προσωπικού
(ονοματεπώνυμο)

**<u>ΜΕΡΟΣ IV</u>**

## ΔΙΚΑΙΩΜΑ ΚΡΑΤΟΥΜΕΝΟΥ ΣΕ ΙΑΤΡΙΚΗ ΕΞΕΤΑΣΗ, ΠΕΡΙΘΑΛΨΗ ΚΑΙ ΠΑΡΑΚΟΛΟΥΘΗΣΗ

**<u>PART A</u>**

රඳවා සිටින සෑම පුද්ගලයෙකුටම ඕනෑම වේලවෙක ඔහු/ඇය කැමති වෛද්‍යවරයෙකු විසින් වෛද්‍ය පරික්ෂණයක් සහ/හෝ ප්‍රතිකාර ලබා ගැනීමට සහ/හෝ අධීක්ෂණය කිරීමට අයිතියක් ඇත සහ ඒ සඳහා කාර්ය මණ්ඩල සිමාජිකයෙකු ඉදිරියේ ඔහවු/ඇයව දුරකථනයෙන් පුද්ගලිකව සම්බන්ධ කරගත හැක හෝ ඔහුට/ඇයට කැමති වෛද්‍යයවරයකුගේ සේවය ලබා ගැනීමට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමට ඔහු/ඇය අකමැතිනම් වෛද්‍ය පරීක්ෂණයක් සහ/හෝ ප්‍රතිකාර සහ/හෝ අධීක්ෂණය ලබා ගැනීමට රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකාරීත්වය විසින් රජයේ වෛද්‍ය වරයකු ලබාදෙනු ලබයි.

රඳවාගෙන සිටින පුද්ගලයා කැමති වෛද්‍යවරයකුගෙන් වෛද්‍ය පරීක්ෂණ,ප්‍රතිකාර,අධීක්ෂණ සඳහා සේවය ලබා ගන්නා විට ඒ සඳහා යන වියදම් රඳවා සිටින පුද්ගලයා විසින් ගෙවිය යුතුයි.

මම, ………………………………………………….,මෙහි පිටපතක් ලබා ගත්තෙමි.

දිනය/Date ……………………

වේලාව/Time………………          රැඳවුම් කරුගේ අත්සන/Detained person's signature

………………………………………

Σε περίπτωση άρνησης του να παραλάβει αντίγραφο του εν λόγω εντύπου ή άρνησης να το υπογράψει να σημειώνονται οι λόγοι της άρνησης του ……………………………………………………………………………………………… ……………………………………………………………………………………………… ……………………………………………………………………………………………..

………….. …………………………………… .
Υπογραφή μέλους του προσωπικού
(ονοματεπώνυμο)

= = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = =

## PART B

ඉහත A කොටසට අදාලව මාගේ අයිතීන් පිළිබඳව දැණුවත් වුවෙමි සහ මා වෛද්‍ය පරීක්ෂණය/අධීක්ෂණය/ප්‍රතිකාර ලබා ගැනීමට බලාපොරොත්තුවන බව දන්වා සිටිමි:

(a) රජයේ වෛද්‍යවරයකුගෙන්

(b) පුද්ගලික වෛද්‍යවරයකුගෙන්(සම්පූර්ණ නම)............................................... වියදම් මා විසින් ගෙවමි.

දිනය/Date ..................

රැඳවුම් කරුගේ අත්සන /Detained person's signature

…………………….......................

දිනය/Date ........................

එකතු කිරීමේ කාලය/Time of collection .....................

………………………………………….
Υπογραφή μέλους του προσωπικού
(ονοματεπώνυμο)

* Σε περίπτωση συμπλήρωσης του ΜΕΡΟΥΣ Β΄ από τον/την κρατούμενο/η να δίδεται σ΄ αυτόν/ήν αντίγραφο του εντύπου.

**ΔΕΥΤΕΡΟΣ ΠΙΝΑΚΑΣ**
**(Κανονισμός 3(1))**

**ΜΕΡΟΣ Ι**

## ΚΑΤΑΛΟΓΟΣ ΥΠΟΧΡΕΩΣΕΩΝ ΚΡΑΤΟΥΜΕΝΩΝ

1. රැඳවුම් මධ්‍යස්ථාණයේ කර්ය මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න.

2. රැඳවුම් මධ්‍යස්ථාණයේ කළමණාකාරීත්වයේ අනුමැතියකින් තොරව කුටි මාරු කිරීම සිදු නොකරන්න.

3. පොදු ස්ථානවල සහ කුටි තුල දක්වා ඇති රඳවා සිටින පුද්ගලයින්ගේ පුද්ගල අයිතිවාසිකම් දක්වා ඇති අකෘති පත්‍ර සහ රැඳවුම් මධ්‍යස්ථාණයේ පළකර ඇති නීති ඇතුළත් පත්‍ර විනාශ නොකරන්න.

4. රැඳවුම් මධ්‍යස්ථාණයට හිතා මතා හානි සිදු නොකරන්න (බිත්තිවල ලිවීම,රැඳවුම් මධ්‍යස්ථාණයේ ඇති භාණ්ඩවලට හානි සිදු කිරීම, ආදිය.)

5. කුටියේ අගුළු තුල දේවල් නොතබන්න.

6. කලබල/කැළඹීම්/උද්ඝෝෂණ/ කැරලි ඇති කිරීම හෝ ඇති නොකරන්න.

7. කාර්ය මණ්ඩල සාමාජිකයන්ට යෝග්‍ය නොවන ලෙස සහ සතුරු ලෙස නොහැසිරෙන්න.

8. රැඳවුම් මධ්‍යස්ථාණයේ කළමණාකාරීත්වයේ නීත්‍යානුකුල උපදෙස් සඳහා අනුකුල වන්න.

9. රැඳවුම් මධ්‍යස්ථාණයේ අපද්‍රව්‍ය නොදමන්න.

10. ඔබගේ සිර කුටිය,සනීපාරක්ෂක පහසුකම් සහ රැඳවුම් මධ්‍යස්ථාණයේ පොදු ස්ථාන පිරිසිඳුව තබා ගන්න.

11. අනෙක් සිර කරුවන් ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා පොළඹවීමෙන් වළකින්න.(උදා.කැරලි ආදිය)

12. කාර්ය මණ්ඩල සාමාජිකයන්ට,අනෙක් රැඳවුම් පුද්ගලයන්ට හෝ අමුත්තන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය භාවිතා නොකරන්න.

13. කාර්ය මණ්ඩල සාමාජිකයන්ට,අනෙක් රැඳවුම් පුද්ගලයන්ට හෝ අමුත්තන්ට එරෙහිව අපහාසාත්මක ලෙස හෝ තර්ජනාත්මක ලෙස භාෂාව භාවිතා නොකරන්න.

14. රැඳවුම් මධ්‍යස්ථාණයේ භාවිතා කිරීම සඳහා තහනම් කර ඇති භාණ්ඩ සඟවා තබා ගැනීමට/භාවිතා කිරීමට/සන්තකයේ තබා ගැනීමට/ග්‍රහණයේ තබා ගැනීමට හෝ ග්‍රහණයේ තබා ගැනීමට උත්සාහ නොගන්න(ලයිටර්,ජංගම දුරකථන,මුදල්,ස්වාර්ණාභරණ,ඖෂධ වර්ග,පටි,ටයි,රේසර්,දුම් වැටි හෝ අනෙකුත් අනතුරු දායක දේවල්)

15. පරිපාලනය විසින් නියම කරනලද දුම් පානය කරන ස්ථාන වලින් පිටත සහ වෙනත් අවස්ථාවලදී දුම් පානය නොකරන්න.

16. වෛද්‍ය නිර්දේශයකින් තොරව තහනම් ද්‍රව්‍ය හෝ බෙහෙත් වර්ග භාවිතා කිරීම/සන්තකයේ තබාගැනීම/ග්‍රහණයේ තබා ගැනීම සිදු නොකරන්න.

17. මධ්‍යසාර පාන වර්ග භාවිතා කිරීම/සන්තකයේ තබාගැනීම/ග්‍රහණයේ තබා ගැනීම සිදු නොකරන්න.

18. අනෙක් රැඳවුම් පුද්ගලයන් සමඟ වාද කිරීමට හෝ ගැටුම් සඳහා නොයන්න.

19. රැඳවුම් මධ්‍යස්ථානයේ ගිනි දැල්වීම් සිදු නොකරන්න.

20. අසභ්‍ය ක්‍රියා සිදු නොකරන්න සහ අනෙක් රැඳවුම් පුද්ගලයන්ට අසභ්‍ය ක්‍රියා සිදු කිරීමට අනුබල නොදෙන්න.

## PART A

මා, ......................................................, රැඳවුම් භාරයේ සිටින පුද්ගලයින්ගේ වගකීම් ඇතුලත් ඉහත ලයිස්තුව, මා හට හැකිතාක් දුරට තේරුම් ගත හැකි භාෂාවෙන් ලබා ගතිමි.

දිනය /Date ..........................

වේලාව /Time.............................. රැඳවුම් කරුගේ අත්සන /Detained person’s signature

.................................

Σε περίπτωση άρνησης του/της να παραλάβει αντίγραφο του εν λόγω καταλόγου ή άρνησης να υπογράψει, να σημειώνονται οι λόγοι της άρνησης.
…………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………
………………………………………………………………………………………………

…………………………………..........
Υπογραφή μέλους του προσωπικού
(ονοματεπώνυμο)

## ΠΛΗΡΟΦΟΡΙΕΣ ΓΙΑ ΤΗΝ ΛΕΙΤΟΥΡΓΙΑ ΤΩΝ ΚΡΑΤΗΤΗΡΙΩΝ

**රැඳවුම් භාරයේ සිටින පුද්ගලයාගේ කාලසටහන:**

රැඳවුම් භාරයේ සිටින පුද්ගලයාගේ කාල සටහන බලන්න-ඇටුතම්විට වරින් වර කළමණාකරු විසින් කාල සටහන සංශෝධනයකල හැකි අතර එය දැනුම් දෙනු ලැබේ.

**අවදි වන වේලාව සහ නින්දට යන වේලාව:**

රැඳවුම් භාරයේ සිටින පුද්ගලයාගේ කාල සටහනේ පරිදි.

**ආහාර වේල:**

රැඳවුම් භාරයේ සිටින පුද්ගලයාගේ කාල සටහනේ පරිදි ආහාර ගැනීම සිදුවේ.

ලබා දෙන ආහාර ගැනීමට බලාපොරොත්තු නොවේනම්, වාට්ටු කළමනාකරුට එය සුදුසු වේලාවක කල්තියා දැනුම් දීමෙන්, ඔබගේ වියඳමින් ආහාර මිලදී ගත හැක.අනෙකුත් රඳවා සිටින පුද්ගලයින් ආහාර අනුභව කරන වේලාවට මෙම ආහාර අනුභව කල යුතුයි.

ආහාර ගත් පසු ඉතුරුවන ආහාර සහ ආහාර ඇසුරුම් කුණු බඳුනට දැමීම හා ස්ථානය පිරිසිඳු කිරීම ඔබේ වගකීමකි.

පිසූ ආහාර කුටියට ගෙන ඒම සපුරා තහනම්ය.

**අමුත්තන් මුණ ගැසිය හැකි කාලය:**

රැඳවුම් භාරයේ සිටින පුද්ගලයාගේ කාල සටහනේ පරිදි.

**නිතිඥයකුගෙන්:**

ඇයට/ඔහුට රැඳවුම්භාරයේ සිටින පුද්ගලයා හා ඕනෑම දිනයක සහ වේලවෙක මුණ ගැසිය හැකිය.නීතිඥවරයෙකු මුණගැසීමට අදාල පෝරමය සහ/හෝ නීතිඥ සේවය අවසන් කිරීමට අදාළව නීතිඥ වරයාගේ සම්පූර්ණ විස්තර සහිතව රඳවා සිටින පුද්ගලයා මධ්‍යස්ථානයේ කළමණාකරුට ලිඛිතව දැනුම් දිය යුතුයි.

**අමුත්තන්/නිතිඥවරුන්** සහ ඔවුන් රැගෙන එන ඕනෑම දෙයක් පරීක්ෂා කරනු ලබයි.

අමුත්තන් මුණගැසෙන ප්‍රදේෂයේ, ආහාර ගැනීම සහ පානය කිරීම සපුරා තහනම්ය.

**දුම්පානය:**

දුම්පානය සඳහා අවසර ඇත්තේ ඊට වෙන්වූ ප්‍රදේෂයේ,ඒ වාගේම ඇතුලත මිදුලේ. කාමර තුල දුම්පානය කිරීම සපුරා තහනම්ය.

රැඳවුම් මධ්‍යස්ථානය තුල ලයිටර් හෝ ගිනි කූරු භාවිතා කිරීම සපුරා තහනම්.

**දුරකථන සන්නිවේදනය:**

දවස පුරාම ජංගම දුරකථන භාවිතයට අවසර ඇත.

රැඳවා සිටින පුද්ගලයන් විසින් ජංගම දුරකථන භාවිතා කරන කාලය මධයස්ථාන කළමණාකාරිත්වයට තිරණය කිරීමට/වෙනස් කිරීමට හැකිය.

ජංගම දුරකතන ආරෝපණය (චාර්ජ්) කිරීම එක් එක් රැඳවුම් පුස්ගලයාගේ වගකීමකි.ආරෝපණ ස්ථාන විනෝද කාමරවල පිහිටා ඇත.

ජංගම දුරකථන ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම ඔබගේ වගකීමකි.

රැඳවුම් මධ්‍යස්ථානයේ ප්‍රමාණවත් තරම් දුරකථන කුටි ඇත සහ ඒ සඳහා අවශ්‍ය කාඩ් මිලදීගැනීමෙන් රඳවා සිටින පුද්ගලයන්ට ඒවා සඳහා ප්‍රවේශ විය හැකිය.

**ෆැක්ස්:**

අමුත්තන්ගේ ප්‍රදේශයේ ෆැක්ස් යන්ත්‍ර තබා ඇත, මේවා ගාස්තු අයකිරීමෙකින් තොරව ඔබට භාවිතා කළ හැකිය.

**පරිඝණක:**

විනෝද ස්ථානවල පරිඝණක ස්ථිපිත කර ඇත. මෙයට අමතරව, අවසරයක් සහිතව, මධ්‍යස්තාන කළමණාකරු පුද්ගලික ලැප්ටොප් පරිඝණක භාවිතයටද ඉඩදිය හැකිය.

පුද්ගලික පරිඝණක ආරෝපණය (චාර්ජ්) කිරීම එක් එක් රැඳවුම් පුස්ගලයාගේ වගකීමකි. ආරෝපණ ස්ථාන විනෝද කාමරවල පිහිටා ඇත. පරිඝණක ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම ඔබගේ වගකීමකි.

**ඖෂධ:**

ඖෂධ ලබා දිය හැක්කේ බෙහෙත් වට්ටෝරු හෝ වෛද්‍ය උපදෙස් මත පමණි. කුටි තුල බෙහෙත් ගැනීමට ඉඩ නැත.

**කුටි/කාමර:**

ස්වාර්ණාභරණ,බෙහෙත්,ගිණි කූරු,ලයිටර්,සපත්තු ලේස්,පටි,ටයි,රේසර් හෝ අනෙකුත් අනතුරු දායක දේවල් කාමරය තුල තබා ගැනීම සපුරා තහනම්.

**භාණ්ඩ මිලදී ගැනීම:**

රැඳවුම් මධ්‍යස්ථානයට බෙදා හැරීමත් සමඟ ඇතැම් භාණ්ඩ මිලදී ගැනීමට රැඳවුම් පුද්ගලයන්ට රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකාරීත්වය අවස්තාව ලබා දිය යුතුයි.රැඳවුම් පුද්ගලයන්ට භාණ්ඩ බෙදා හැරීමට පෙර ආරක්ෂක අරමුණු පිණිස පරීක්ෂා කරනු ලබයි.

සියළුම භාණ්ඩ මිලදී ගැනීම සිදු කල යුත්තේ රැඳවුම් පුද්ගලයන්ගේ වියදමිනි,මේ මුදල රැඳවුම් පුද්ගලයන්ගේ අරමුදලින් අඩු කරනු ලබයි. මිලදී ගත් බවට ඇති සාක්ෂි තබා ගත යුතුයි.

**කාමරයේ/කුටියේ පිරිසිඳුකම:**

කුටියේ පිරිසිඳුකම ඔබගේ වගකීමකි.

මධ්‍යස්ථානයේ පිරිසිඳු කරන්නන් විසින් ඇතැම් විට කුටි පිරිසිඳු කරනු ලබයි.පිරිසිඳු කරන අතර තුර, ඔබගේ පෞද්ගලික භාණ්ඩ සුරක්ෂිතව තබා ගැනීම ඔබගේ වගකීමකි.

පිරිසිඳු කරන්නන් විසින් පොදු ස්ථාන පිරිසිඳු කරන කාලයන් තලදී පිරිසිඳු කරන විට,රැඳවුම් කරුවන් කුටි තුල සිටිය යුතුයි.

කුටි දිනපතා පරීක්ෂා කළ හැකිය.

**පෞද්ගලික සනීපාරක්ෂාව:**

පෞද්ගලික සනීපරෙක්ෂාව සඳහා වු නිති දැඩිව පිළිපදින්න.

රෙදි සෝදන යන්ත්‍ර සහ වේලන යන්ත්‍ර ක්‍රියාත්මක කරනුයේ කාල සටහනකට අනුවය සහ එක් එක් පුද්ගලයාගේ වගකිමකි ඔවුන් භාවිතා කරන රෙදි,ඇතිරිලි,තුවා යනාදිය සෝදා ගැනීම.

රෙදි සෝදන යන්ත්‍ර සහ වේලන යන්ත්‍ර ක්‍රියාත්මක කරනුයේ "ටෝකන්" එකක් සමඟය,වාට්ටුවේ කළමණාකාරතුමා විසින් එය මුදල් අය කිරීමකින් තොරව රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන්ට දෙනු ලබයි.රෙදි දැලක් තුල දැමිය යුතුයි,එය වාට්ටුවේ කළමණාකාරතුමා ලබාදෙනු ලබයි.

රැවුල බෑම සිදු කරනු ලබන්නේ කාර්ය මණ්ඩල සාමාජිකයකු ඉදිරියේ, ඔවුන් රැඳවුම් කරුවන්ට රේසර් ලබාදිම සහ නැවත ඔවුන්ගෙන් ඒවා ගනු ලබයි.

**සංචලනය(ගමන් කිරීම්):**

රැඳවුම් මධ්‍යස්ථානයෙන් පිටත සිදුවන සියළුම ගමන් කිරීම් සිදු වනුයේ මාංචු ද සමඟයි.

රැඳවුම් මධ්‍යස්ථානයට නැවත පැමිණි පසු, ආරක්ෂක ශේතුන් මත රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන් පරීක්ෂාවට ලක්ලරනු ලබයි.

**අවන්හල් සහ ප්‍රදේශ**

අවන්හල් සහ විවේක ස්ථාන දවසේ පැය 24 පුරාම විවෘතය.

**එලිමහන් විනෝද ප්‍රදේශ – ඇතුල් මිදුල:**

එලිමහන් ප්‍රදේශ භාවිතා කළ හැක්කේ රැඳවුම් පුද්ගලයන්ගේ කාල සටහනට අනුවය.

**ආගමික අයිතිවාසිකම්:**

ඕනෑම රැඳවුම් පුද්ගලයෙක්ට ඔහුගේ/ඇයගේ ආගමට අදාල පුජකවරයෙකු මුණ ගැසීමට අවසර ඇත.

රඳවා සිටින සෑම පුද්ගලයෙක්ගේම ආගමික විශ්වාස සඳහා ගෞරව කරනු ලබයි.

රඳවා සිටින සෑම පුද්ගලයෙකුටම ඔහුගේ/ඇයගේ ආගමට අදාල කටයුතු වල යෙදීමට අයිතියක් ඇත.

**ක්‍රියාකාරකම්:**

මධ්‍යස්ථානය තුල පොත්/සඟරා සහ ක්‍රීඩා පුවරු තබා ඇත,මේවා රැඳවුම් පුද්ගලයන්ට භාවිතා කළ හැකිය.

.

රඳවා සිටින පුද්ගලයින්ගේ කාල සටහනට අනුව විනෝදාත්මක ක්‍රියාකාරකම්වල යෙදිය හැකිය.

**මනෝවිද්‍යාඥයා- වෛද්‍යවරයා**

**සෞඛ්‍ය කාර්ය මණ්ඩලය:** මධ්‍යස්ථානය විසින් වෛද්‍යවරුන්ගේ,හෙදියන්ගේ සහ මනෝවිද්‍යාඥයින්ගේ සේවය ලබාදෙනුයේ රඳවා සිටින පුද්ගලයින්ගේ කාල සටහනට අනුවයි.

**ප්‍රකීර්ණක**

**(නානා ප්‍රකාර):**

- රැඳවුම් මධ්‍යස්ථානයට හිතා මතා සිදු කරන හානි සඳහා ඔබට එරෙහිව නඩු පැවරිය හැකි අතර අළුත් වැඩියා කිරීම සඳහා යන වියදමද ඔබට දැරීමට සිදු විය හැකිය.

- ඕනෑම ඉල්ලීමක් විශේෂ පෝරමයක් මගින් ලිඛිතව රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකාරතුමා වෙතට යොමු කළ යුතුයි.

**සීමා කිරීම හෝ**

**අයිතිවාසිකම් අහිමි කිරීම:** යම් හෙයකින් දෙවන වගුවෙහි දැක්වෙන " රැඳවුම්භාරයේ පසුවන පුද්ගලයින්ගේ" වගකීම් ඔබ කඩ කලහොත්,රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකාරතුමා විසින් ඔබගේ සමහර අයිතින් සීමා කිරීමට හෝ අහිමි කිරීමට ඉඩ ඇත,ඔහු/ඇය කරුණු පරීක්ෂා කිරීමෙන් සහ ඔබට සවන් දීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව.

**පැමිණිලි ඉදිරිපත් කිරීම:** ඔබට පැමිණිලි ඉදිරිපත් කළ හැකිය: (a) රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකාරතුමා විසින් ඔබගේ අයිතින් සීමා කිරීමට හෝ අහිමි කිරීමට ගත් තීරණය සම්බන්ධව,සහ (b) රඳවා තබා ගැනීමට හෝ සැලකීම සම්බන්ධව ඕනෑම කාරණාවකට,කළමණාකාරතුමා විසින් තීරණය ගත් දින සිට දින 15ක් ඇතුළත හෝ සිදුවීම සිදුවුනු දින,පැමිණිලි කමිටුවට.
ඔබේ පැමිණිලි සෑම වාට්ටුවකම තබා ඇති පැමිණිලි පෙට්ටියට ලිඛිතව ඉදිරිපත් කළ හැකිය.

**පුද්ගලික තොරතුරු:** නීතියේ සපයා ඇති බලතල සහ විධි විධානවලට අනුකූලව සයිප්‍රස් පොලිසිය මඟින් පුද්ගලික තොරතුරු එකතු කිරීම,නඩත්තු කිරීම සහ දත්ත සකස් කිරීම සිදු කරයි.

පුද්ගලයින්ගේ ස්වාභාවය ආරක්ෂාකිරීම සඳහා පුද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල නියමයන්ට අනුකූලව දත්ත තබා ගැනීම සහ සකස් කිරීම කරයි.(පුද්ගලික දත්ත ආරක්ෂණ නීති සම්පාදනය).මේ හේතුව නිසා,පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම පිණිස විවිධ ක්‍රියා පටි පාටි සහ නීති පවත්වනු ලබයි.ඔබේ පුද්ගලික දත්ත/තොරතුරු ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වැඩිවිස්තර ඇමුණුමA මඟින් දැනගත හැකියි.





**ΠΑΡΑΡΤΗΜΑ Α**

**ΠΡΟΣΩΠΙΚΑ ΔΕΔΟΜΕΝΑ**

**යුරෝපීය පාර්ලිමේන්තුවේ (EU) 2016/679 නියාමනයේ III වන පරිච්ඡේදය (දත්ත විෂයේ අයිතිවාසින්) පදනම මත තොරතුරු ලබාදේ සහ පුද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් පුද්ගල ස්වාභාවය ආරක්ෂා කිරීම සඳහා 2016 අප්‍රේල් 27 සභාවේ සහ එවැනි දත්තවල නිදහස් චලනය සහ අවලංගු කිරීමේ නියෝගය 95/46/EC (සාමාන්‍ය දත්ත ආරක්ෂණ නියාමනය) සහ එහි ක්‍රියාත්මක කිරීමේ නීතිය 125(1)/2018.**

1. සයිප්‍රස් පොලිසිය (මෙනෝයා හි රැඳවුම් මධ්‍යස්ථානය) රැඳවුම් මධ්‍යස්ථාන ස්ථාන සඳහා වූ තහනම් සංක්‍රමණ නීතිය 83(1)/2011 සහ ඒ යටතේ නිකුත් කරන ලද රෙගුලාසි වලට අනුව බලතල සහ නියාමන රාමුවතුල පුද්ගලික දත්ත එකතු කිරීම,නඩත්තුව සහ ක්‍රියාවලියට බඳුන් කිරීම සිදු කරයි.

2. පුද්ගලයින්ගේ ස්වාභාවය ආරක්ෂාකිරීම සඳහා පුද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් නිත්‍යානුකූල නියමයන්ට අනුකූලව දත්ත තබා ගැනීම සහ සකස් කිරීම කරයි.(පුද්ගලික දත්ත ආරක්ෂණ නීති සම්පාදනය).මේ හේතුව නිසා,පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම පිණිස විවිධ ක්‍රියා පටි පාටි සහ නීති පවත්වනු ලබයි.

3. සයිප්‍රස් ජනරජයේ පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම සඳහා සම්පාදනය වූ නීති:

- යුරෝපීය පාර්ලිමේන්තුවේ (EU) 2016/679 නියාමනයේ සහ පුද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් පුද්ගල ස්වාභාවය ආරක්ෂා කිරීම සඳහා 2016 අප්‍රේල් 27 සභාවේ සහ එවැනි දත්තවල නිදහස් චලනය සහ අවලංගු කිරීමේ නියෝගය 95/46/EC (සාමාන්‍ය දත්ත ආරක්ෂණ නියාමනය) සහ පුද්ගලික දත්ත සකස් කිරීම සහ එවැනි දත්තවල නිදහස් චලනය සම්බන්ධව පුද්ගල ස්වාභාවය ආරක්ෂා කිරීම පිළිබඳව සහ එහි ක්‍රියාත්මක කිරීමේ නීතිය (Law 125(l)/2018).

- සාපරාධී වැරදි වැලැක්වීම,විමර්ශනය කිරීම,අනාවරණය කිරීම හෝ නඩු පැවරීම හෝ අපරාධ දඬුවම් ක්‍රියාත්මක කිරීම යන අරමුණු සඳහා නිසි බලධාරීන් විසින් පුද්ගලික දත්ත සැකසීමේදී පුද්ගල ස්වාභාවය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සහ එවැනි දත්ත වල නිදහස් චලනය හා සම්බන්ධවූ 2019 පනත(44(1)/2019)

4. රැස් කරගත් දත්ත මුද්‍රිත සහ විද්‍යුත් ආකාරයෙන් තබාගෙන ඇත.වෙනත් හේතුන් මතු වුයේ නැතිනම්,මුද්‍රිත මාධ්‍යයෙන් ඇති ගොනුව අවුරුදු 6ක කාලයක් තබා ගනී. සෑම ගොනුවක් සඳහාම,එහි අඩංගු දත්තවල ආරක්ෂාව සහතික කිරීම සහ කිසියම් නීති විරෝධී ප්‍රවේශයක් වැළැක්වීම සඳහා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. විද්‍යුත් ගොනුව දින නියමයක් නොමැතිව තබා ගත හැකිවේ.එකතු කරන ලද දත්ත අදාළ නීති යටතේ රාජකාරී කරන අනෙකුත් ලබන්නන් හට සම්ප්‍රේෂණය කල හැකිය සහ සකස් කළ හැකිය ඔවුන්ගේ රාජකාරී සඳහා.( උදා): පරිපාලන කොමසාරිස්,අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය, ජනරජයේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය, සයිප්‍රස් ජනරජයේ නීතිපති, ජාත්‍යන්තර අපරාධ විමර්ශන පොලිස් සංවිධානය සහ නීතිය බලාත්මක කිරීමේ සහයෝගතාව සඳහා වූ යුරෝපීය සංගමයේ නියෝජිත)

5. යම් හෙයකින් කිසියම් පුද්ගලයෙක් ඔහුට/ඇයට සම්බන්ධ දත්ත වෙත ප්‍රවේශ වීමට බලාපොරොත්තුවේ නම්, පුද්ගලිකව හෝ නිසි බලයලත් පුද්ගලයෙක් හරහා, ඔහුට/ඇයට ප්‍රවේශවීමට අයිතියක් ඇත, ඒ වාගේම දත්ත නිවැරදි කිරීමට,මකා දැමීමට හෝ දත්ත සැකසීම සීමා කිරීමට අයිතියක් ඇත,මෙය ඔහු/ඇය විසින් පොලිස් ප්‍රධානියා වන දත්ත පාලක වෙත කරන ඉල්ලීමක් මගින් ක්‍රියාක්මක කළ හැක. අදාල පෝරමය පොලිස් ස්ථානයෙන් ලබා ගත හැකිය (ඉල්ලීමක් මත). ඒ වාගේම මෙය පොලිසියේ වෙබ් අඩවියේද පළ කර ඇත.
https://www.police.gov.cy/police/police.nsf/All/112610271A168938C225853C0018764A?OpenDocument

6. දත්ත විෂයෙහි අයිතිවාසිකම් වඩාත් විස්තරාත්මකව පහත දක්වා ඇත:

**6.1. ප්‍රවේශ වීමට ඇති අයිතිය:**

ඔබ ගැන සඳහන් සහ පොලිසිය විසින් සැකසුණු පුද්ගලික දත්ත ගැන දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.මුදල් ගෙවීමකින් තොරව ප්‍රවේශ වීමට අයිතියක් ඇත සහ හැකි ඉක්මණින් එය ඉටු කර දෙනු ලබයි. ඉල්ලීම පදනම් විරහිත හෝ සීමාව ඉක්මවයි නම්,සයිප්‍රස් පොලිසියට අනුරූප පිරි වැයක් නියම කළ හැකිය.ඇතැම් අවස්ථාවලදී,පුද්ගලික දත්ත ආරක්ෂා කිරීමේ කොමසාරිස් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව ප්‍රවේශ වීමේ අයිතිය සීමා කළ හැකියි.

**6.2. දත්ත නිවැරදි කිරීම / මකා දැමීම/ දත්ත සැකසීම සීමා කිරීමේ අයිතිය:**

ඔබ හා සම්බන්ධ දත්ත සැකසීම නිවැරදි කිරීම,මකා දැමීම හෝ සීමා කිරීම ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත.කෙසේ වෙතත්, අදාළ නීති සම්පාදනයට අනුකූලව ඔබගේ ඉල්ලීම ලබා නොදෙනු ඇත.

**6.3. පැමිණිලි කිරීමේ අයිතිය:**

ඔබගේ පුද්ගලික දත්ත සැකසීමේදී නීතිය උල්ලංඝනය කර ඇති බවට ඔබ විශ්වාස කරයි නම්,පුද්ගලික දත්ත ආරක්ෂා කිරීමේ කොමසාරිස් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට අයිතියක් ඇත.

**6.4. අභියාචනය කිරීමේ අයිතිය:**

පුද්ගලික දත්ත සැකසීමේ ප්‍රත්ඵලයක් ලෙස ඔබගේ අයිතින් උල්ලංඝනයවී ඇති බවට ඔබ සිතයි නම්,පරිපාලන අධිකරණය හමුවේ පොලිසියට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔබට අයිතියක් ඇත.

*සයිප්‍රස් පොලිසියේ දත්ත ආරක්ෂණ නිළධාරි:*
*e-mail address: dpopolice@police.gov.cy*